

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2021

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

“ මග නැගුම මහ මැදුර ” , 7වන මහල,

ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,

කොස්වත්ත, බත්තරමුල්ල.

පෙරවදන

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව - 2021,

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මඟින් ලබා දී ඇති උපදෙස් අනුව සකස් කර ඇත.

මෙම වාර්තාව මඟින් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ භෞතික හා මූල්‍ය කාර්යසාධනය පිළිබඳව සවිස්තරාත්මකව දක්වා ඇත.

පටුන

1 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

01. ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

1.1 හැදින්වීම 6 - 8

1.2 අමාත්‍යාංහයේ දැක්ම හා මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම 09

1.2.2 මෙහෙවර 09

1.2.3 ප්‍රධාන අරමුණු 09

1.3 ප්‍රධාන කාර්යයන් හා විෂය පථය 10

1.4 සංවිධාන සටහන 11

1.5 අනුමත කාර්ය මණ්ඩල තොරතුරු 12 - 13

1.6 අමාත්‍යාංශයේ අභ්‍යන්තර සංයුතිය 14 - 16

1.7 වෙනත් ව්‍යවස්ථාපිත ආයතන 17

1.7.1 රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (SD&CC) 17 -18

1.7.2 ග්‍රාමීය පාලම් අංශය 18

2 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

02 කාර්ය සාධන, ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 වැඩසටහන්හි කාර්ය සාධනය 20

2.1.1 ඒ දඬු පාලම් වැල් පාලම් වෙනුවට කුඩා පාලම් ඉදිකිරීම 20

2.1.2 ග්‍රාමීය පාලම් වැඩසටහන 21

2.1.3 මහාමාර්ග දෙපස පැල රෝපණය කිරීමේ වැඩසටහන 21

2.2 අයවැය ප්‍රතිපාදන 2021 - ආයෝජන සැලැස්ම -2021 22

2.3 ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන් ප්‍රගතිය 23

2.4 භෞතික හා මූල්‍ය ප්‍රගතිය - ග්‍රාමීය පාලම් වැඩසටහන 24

2.4 මග දෙපස රුක් රෝපණ වැඩසටහන් ප්‍රගතිය

3 පරිච්ඡේදය - සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

03 සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

4 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

04 කාර්ය සාධන දර්ශක 29

4.1 රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශකයන්හි ප්‍රගතිය 30

5 පරිච්ඡේදය - තිරසරසංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

05 තිරසර සංවර්ධන අභිමතාර්ත ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය 32

6 පරිච්ඡේදය - මානව සම්පත් කළමණාකරණය

06 මානව සම්පත් කළමණාකරණය 34

7 පරිච්ඡේදය

07 අනුකූලතා වාර්තාව 36 - 43

8 ඡායාරූප එකතුව

9 ඇමුණුම්

ඒගණන වාර්තාව 52-63

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ

1.0 හැඳින්වීම

රටේ සමස්ථ සංවර්ධනයේදී එම රටේ මාර්ග පද්ධතිය හා ප්‍රවාහන පහසුකම් විශාල කාර්යභාරයක් ඉටුකරයි. භාණ්ඩ නිෂ්පාදනය හා සේවාවන් ලබා ගැනීම, නිෂ්පාදනයන් වෙළඳපොළට බෙදාහැරීම හා පාසැල් රෝහල් වැනි මූලික සේවාවන් සපයන ආයතන වෙත පහසුවෙන් ළඟා වීම වැනි කටයුතු සඳහා යහපත් මාර්ග පද්ධතිය පිටුවහලක් වේ.

එසේම එදිනෙදා කටයුතු අපේක්ෂිත අයුරින් පහසුවෙන් කරගැනීමටද පහසුවක් වන අතර, සංවර්ධනයේ ආර්ථික හා සමාජීය වශයෙන් වන ප්‍රතිලාභයන් සමස්ථ ප්‍රජාව වෙත සමව බේදී යාමටද හේතු වේ. එබැවින්, ග්‍රාමීය මාර්ග ද ඇතුලත් වන මාර්ග පද්ධතියේ අඛණ්ඩ සංවර්ධනය වේගවත් කිරීමට අත්‍යාවශ්‍ය සාධකයක් බවට පත්ව ඇත.

කාර්යක්ෂම හා පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීම සඳහා අවශ්‍ය වන මාර්ග ජාලය වැඩි දියුණු කිරීම රජයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශය වන “ සෞභාග්‍යයේ දැක්ම ” හි රජයේ මූලික අවශ්‍යතාවයක් ලෙස දක්වා ඇත. ඒ අනුව රජයේ සංවර්ධන ප්‍රමුඛතාවයන්ට අනුගතව මාර්ග අංශයට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, උපාය මාර්ග හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රීය ආයතනය මහාමාර්ග අමාත්‍යාංශය වේ. එසේම, සියළු දෙනාටම හොඳ ප්‍රවාහන පහසුකම් ලබා දීම හා සමාජ ආර්ථික සංවර්ධනය තහවුරු කිරීම සඳහා ඉවහල් වන ජාතික මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ හා නඩත්තු කිරීමේ පුරෝගාමීයාද වේ.

ග්‍රාමීය මාර්ග ඇතුළුව සමස්ථ මාර්ග ජාලයම සංවර්ධනය කිරීමේ විශාල අවශ්‍යතාවයක් පවතින බැවින් ග්‍රාමීය මාර්ග අංශය හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කරගනිමින්, 2187/27 හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා රාජ්‍ය අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීමට ප්‍රමුඛතාවය දෙන ලදී. ඒ අනුව, ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීම සහ ප්‍රවේශ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ග්‍රාමීය මාර්ග ජාලය හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය හා නවීකරණය කිරීම රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ප්‍රමුඛතා කාර්යයක් ලෙස හඳුනාගෙන ඇත.

රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රමුඛතාවයන් ලෙස පහත සඳහන් ප්‍රමුඛතාවයන් හඳුනාගෙන ඇත.

1. ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය හා නවීකරණය කිරීම.
2. ග්‍රාමීය මාර්ග ජාලය හා සම්බන්ධ වන ග්‍රාමීය පාලම් පද්ධතිය ඉදිකිරීම හා නවීකරණය.
3. මහා මාර්ග හා අධිවේගී මාර්ග ජාලය හා සම්බන්ධ වන විකල්ප මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම.

රටේ මාර්ග පද්ධතිය ජාතික මාර්ග, (A හා B පංතියේ මාර්ග හා අධිවේගී මාර්ග) පළාත් මාර්ග (C හා D පංතියේ මාර්ග) වර්ගීකරණය නොකළ පළාත් පාලන ආයතන සතු මාර්ග සහ විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු හා ආයතන විසින් නඩත්තු කරනු ලබන මාර්ග (වතු ආශ්‍රිත මාර්ග, කෘෂි මාර්ග, වාරිමාර්ග පද්ධතියට අයත් මාර්ග) වලින් සමන්විත වේ.

පසුගිය වර්ෂයන්හිදී විවිධ ක්‍රමවේදයන්, එනම් මොටර් ග්‍රේඩර් කිරීම, බොරළු දැමීම,තාර දැමීම, කොන්ක්‍රීට් ඇතිරීම හා අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ඇල්ලීම වැනි ක්‍රමවේදයන් හදුන්වා දෙමින් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම සඳහා මහාමාර්ග අමාත්‍යාංශය විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

ගුණාත්මක භාවය, කල් පැවැත්ම හා පාරිසරික තිරසාරත්වය පිළිබඳව අවධානය යොමු කරමින්, ඉහළ ආර්ථික හා තාක්ෂණික ප්‍රතිලාභ ලගා කරගැනීමේ අරමුණින් අන්තර් සම්බන්ධිත කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ ක්‍රමවේදය මගින් සංවර්ධනය කිරීමට ප්‍රමුඛතාවය ලබාදෙන ලදී. පසුගිය වසර කිහිපය තුල කිලෝමීටර විශාල ප්‍රමාණයක් සංවර්ධනය කලත්, අපගේ අවධානය යොමු කර සංවර්ධනය කළ යුතු, අඩක් සංවර්ධනය කළ හා අළුතින් ඉදිවූ මාර්ග ඇති අතර, ග්‍රාමීය අවශ්‍යතා ඉටු කිරීම, ගම් හා නගර අතර සහ සම්බන්ධතාවය වර්ධනය කිරීම සඳහා එම මාර්ග සංවර්ධනය කෙරෙහිද විශේෂ අවධානය යොමු කල යුතු වේ.

ජනගහනය වර්ධනය වීම, නව නිවාස සංවර්ධනය හා භාවිතා කරනු ලබන වාහන ප්‍රමාණය වැඩිවීම වැනි කරුණු මත ප්‍රවේශ අවශ්‍යතා වැඩි වී ඇත.

වසර ගණනාවක් තුල මහාමාර්ග අමාත්‍යාංශය යටතේ විවිධ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇති අතර, ඒ තුලින් රටේ සමාජ ආර්ථික සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දී ඇත. එමෙන්ම, ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ජාතික මාර්ග ජාලය හා සම්බන්ධ වන විකල්ප මාර්ග සංවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන කිලෝමීටර් 100,000 යේ සංවර්ධන වැඩසටහනට සමගාමීව නව ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහනක් ආරම්භ කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

රජයේ ජාතික ප්‍රතිපත්තියට අනුව යමින් 2021 වසර තුල ව්‍යාපෘති/ වැඩ සටහන් කිහිපයක් රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලදී.

ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම තුලින් වෙළඳපොළ මෙන්ම අනෙකුත් ආර්ථික සහ සමාජ සේවාවන් සඳහා සම්බන්ධතාවයන් ගොඩනැගේ. හොඳ මාර්ග පද්ධතියක් හරහා රටේ බෝහෝ ප්‍රදේශ වල සංවර්ධනයට මෙන්ම වෙළඳපොල සමඟ සහසම්බන්ධතාවයන් ගොඩනගා ගැනීමට හා එමගින් ජීවන ක්‍රමෝපායන් වෙනස් කිරීමටත් හේතු සාධක වී ඇත.

ග්‍රාමීය මාර්ග සංවර්ධනයට අමතරව ග්‍රාමීය පාලම් සංවර්ධනයටද මූල්‍ය ප්‍රතිපාදන වෙන් වී තිබුණි. සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමට, සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට, මෙන්ම එදිනෙදා කටයුතු පහසුකරලීම සඳහා ග්‍රාමීය මාර්ග පද්ධතිය හා බැඳුණු පාලම් ඉදිකිරම සඳහා රුපියල් බිලියන 9.5 ක අයවැය ප්‍රතිපාදනයක් වෙන්වී තිබුනි. මෙම වැඩසටහන මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක විය.

රාජ්‍ය අමාත්‍යාංශය අඩු වියදම් ග්‍රාමීය පාලම් ඉදිකිරීම හා සැහැල්ලු මෙන්ම බරවාහන ධාවනය කල හැකි ග්‍රාමීය පාලම් ඉදිකරීම සඳහා වැඩසටහන් දෙකක් ආරම්භ කරන ලදී.

විදුලි කණු, දුරකථන කණු, ඉවත් කරන ලද පාලම්, වානේ කණු, දුම්රිය පීලි වැනි ද්‍රව්‍ය උපයෝගී කරගෙන අඩු පිරිවැයකින් ඉදිකල හැකි කුඩා මගී පාලම්, කුඩා වාහන ගමන් කල හැකි පාලම් ඉදිකිරීම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ආරම්භ කරන ලදී. ජනතාවගේ වැඩි අවශ්‍යතාව හා ඉල්ලීම් සැලකිල්ලට ගෙන සැහැල්ලු මෙන්ම බර වාහනද ධාවනය කල හැකි ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ වැඩසටහනක් ද ආරම්භ කරන ලදී. මේ මගින් ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රවාහන ගැටළුව අවම කරමින්, ප්‍රධාන මාර්ග ජාලය හා සම්බන්ධ විය හැකි ප්‍රවේශ පහසුකම් පුළුල් කිරීමට බලාපොරොත්තු විය.

ග්‍රාමීය පාලම් ඉදිකිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාවගෙන් මෙන්ම දේශපාලන අධිකාරියෙන්ද ඉල්ලීම් ඉදිරිපත් විය. මෙම වැඩ සටහන 2021 වසරේදි ආරම්භ කරන ලද අතර, ඉදිරි වසර කිහිපය තුලදි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මෙම වැඩසටහනේ එක් අරමුණක් වන්නේ දේශීය කුඩා කොන්ත්‍රාත්කරුවන් හට අවස්ථාව ලබා දෙමින් පාලම් ඉදිකිරීමට දායක කර ගැනීමයි.

රජයේ ජාතික ප්‍රතිපත්ති මාලාව වන “ සෞභාග්‍යයේ දැක්ම ” හි තිරසර කළමණාකරණ සංකල්පය යටතේ ග්‍රාමීය මාර්ග වැඩසටහන් හා ග්‍රාමීය පාලම් වැඩසටහනට සමගාමීව රාජ්‍ය අමාත්‍යාංශය මගින් මාර්ග දෙපස පැල සිටුවීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

මාර්ග දෙපස පැල සිටුවීමේ වැඩසටහනේ අරමුණ වන්නේ වැඩි වශයෙන් ඔක්සිජන් පරිසරයට මුදා හරිමින් කාබන්ඩයොක්සයිඩ් (CO_2) උරාගනිමින්, පදිකයන්ට සහ වාහන පදවන්නන්ට සෙවන සලසන, නගර අලංකරණ වැඩි කරන, ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කිරීමයි. එම අරමුණින් මාර්ග සංවර්ධන වැඩසටහන හා පාලම් සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව පැල සිටුවීම සිදු කරන ලදී. එක් එක් ප්‍රදේශ වලට, දේශගුණික තත්වයන්ට ගැලපෙන ශාක තෝරා ගැනීමට මේ සඳහා අවධානය යොමු කර තිබුණි.

2020 වසරේ සිට අඛන්ඩව බල පැවැත්වූ කෝවිඩ් - 19 වසංගත තත්වය තුළ රජය විසින් රට වසා දැමීම සහ සමාජ දුරස්තභාවය පිළිබඳව අවධානයක් යොමු කළ බැවින් රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශය සඳහා නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රමයක් හදුන්වා දෙන ලදී. මෙම වසංගත තත්වය නිසා වසරේ මුල් කාලය තුළ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන් මන්දගාමීව ක්‍රියාත්මක වීම හෝ ඇතැම් ව්‍යාපෘති ඇණ හිටීමටද හේතු විය. කෝවිඩ් - 19 වසංගත තත්වය රටේ සියළුම අංශ කෙරෙහි සැලකිය යුතු මට්ටමේ බලපෑමක් කරන ලද අතර, වසංගත තත්වය විසින් ඇති කරන ලද අභියෝග මැද රාජ්‍ය අමාත්‍යාංශය ග්‍රාමීය මාර්ග වැඩ සටහන් සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩ සටහන් කිලෝමීටර් 100,000 යේ මාර්ග ප්‍රතිසංස්කරණ වැඩසටහනට සමගාමීව ආරම්භ කරන ලදී.

කොරෝනා වංසගත තත්වය යටතේ විවිධ බාධාවන් හා අභියෝග වලට මුහුණ දීමට සිදු වුවත්, ගරු මහා මාර්ග අමාත්‍ය හා ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමාගේ උපදෙස් හා මඟපෙන්වීම යටතේ, ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් හැකි පමණින් කෝවිඩ් -19 සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සෞඛ්‍ය පුරුදු අනුගමනය කරමින් හා සමාජ දුරස්ථභාවය ආරක්ෂා කරමින් ග්‍රාමීය පාලම් වැඩසටහන් සහ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන ඉතා සීමිත මානව සම්පත් හා සීමිත භෞතික සම්පත් යටතේ අඛණ්ඩව ඉටුකරගෙන යන ලදී.

වාර්ෂිකව අයවැය මගින් වෙන්වූ මූල්‍ය ප්‍රතිපාදන පාදක කරගෙන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග වැඩ සටහන හා ග්‍රාමීය පාලම් වැඩ සටහනට කෝවිඩ් - 19වසංගත තත්වයට අමතරව, වෙළඳ පල අමුද්‍රව්‍ය මිල නිතර නිතර ඉහල යාම, අමුද්‍රව්‍ය හිඟය මෙන්ම වර්ෂාවසානයේ ඇති වූ අයහපත් කාලගුණ තත්වයන්ද මෙම සංවර්ධන වැඩසටහන් හි අපේක්ෂිත පරමාර්ථ ළඟා කරගැනීම බාධා පැමිණ වූ හේතු සාදක විය. විශේෂයෙන් ග්‍රාමීය මාර්ග වැඩසටහනේ සමස්ථ ප්‍රතිපාදන ප්‍රමාණය පදනම් කොටගෙන ව්‍යාපෘති අනුමත කර තිබුනද, ගිවිසුම් ගතව වැඩ ආරම්භ කර තිබුනද සිමෙන්ති හා අනෙකුත් අමුද්‍රව්‍ය හිඟය මත එම ව්‍යාපෘති අවසන් කළ නොහැකි තත්වයකට පත් විය. එසේම වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත් කළද අපේක්ෂිත අක්මුදල් මහා භාණ්ඩාගාරයේන් නොලැබීම නිසා ගෙවීම් කිරීමට නොහැකි විය. එබැවින් සමස්ථයක් ලෙස ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා වීමට නොහැකි විය.

මෙම වාර්තාව මගින් 2021 දෙසැම්බර් 31 දක්වා ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් අනුමත ප්‍රතිපාදන යටතේ ඉහත කෝවිඩ් තත්වය තුළ ලඟා කරගත් මූල්‍ය හා භෞතික ප්‍රගතිය මෙන්ම ග්‍රාමීය මාර්ග අංශය හා ග්‍රාමීය පාලම් අංශයේ කාර්යසාධනය ඉදිරිපත් කරයි.

1.1 අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර සහ අරමුණු

1.1.1

දැක්ම

" සහසම්බන්ධතාවයන් තුලින් සියළුම දෙනාට යහපත් ජීවන තත්වයක් "

1.1.2

මෙහෙවර

පුළුල් සහයෝගීතාව, තිරසාර නායකත්වය හා කාර්යක්ෂම යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ග්‍රාමීය ජීවනෝපාය සඳහා වන මාර්ග ජාලය ඇති කිරීම

1.1.3

අරමුණු

1. ග්‍රාමීය මාර්ග, පාලම් හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අදාල වන උපායමාර්ග වැඩි දියුණු කිරීම.
2. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය නව ක්‍රමවේද තාක්ෂණය හා යන්ත්‍රෝපකරණ හඳුන්වා දීම.
3. සහසම්බන්ධතාවයන් හරහා රැකියා අවස්ථා සහ ව්‍යවසායකත්වය සඳහා ධාරිතාවයන් හා අවස්ථා වැඩි දියුණු කිරීම.
4. මාර්ග දෙපස පැල සිටුවීම වැනි තිරසාර සංවර්ධන සංකල්ප ක්‍රියාත්මක කිරීම තුළින් පාරසරික තිරසාර සංවර්ධනයට දායක වීම.
5. සංවර්ධනය සඳහා වඩාත් සුදුසු සංවර්ධනය නොවූ ග්‍රාමීය මාර්ග, පාලම් හා අනෙකුත් යටිතල පහසුකම් හඳුනා ගැනීම සහ කාර්යක්ෂම ග්‍රාමීය මාර්ග සහ අනෙකුත් යටිතල පහසුකම් පද්ධතියක් සඳහා ඒවා ප්‍රතිසංස්කරණය කිරීම.

1.2 ප්‍රධාන කාර්යයන් හා විෂය පථය


විෂය පථය

ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය කිරීම සහ නවීකරණය කිරීම.

කාර්යයන් හා කර්තව්‍යයන්

1. " සහසම්බන්ධිත නවීන මාර්ග පද්ධතියක් "ඇති කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඊට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩ පිලිවෙල යටතේ ඇති අමාත්‍යාංශ විෂය පථයට අයත් වැඩසටහන් ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම පසුවිපරම් සහ ප්‍රගති සමාලෝචනය කිරීම මෙන්ම කේෂේත්‍රයට අදාල තොරතුරු සහ දත්ත පද්ධතීන් පවත්වාගෙන යාම.
3. ග්‍රාමීය මාර්ග සහ යටිතල ව්‍යුහයන්ගේ නඩත්තුව සඳහා අදාල ආයතන සහ ප්‍රජාව සමග ඒකාබද්ධව, ප්‍රජා පාදක ක්‍රමවේදයන් මත තිරසාර නඩත්තු ක්‍රම සකස් කිරීම සහ පවත්වාගෙන යෑම.
4. කෙටිකාලීන හා මාධ්‍ය කාලීන ලෙස මාර්ග සහ අවශේෂ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ව්‍යාපෘති සැකසීම මෙන්ම ඒ හා සම්බන්ධ ආයෝජන සැලැස්ම සැකසීම.

1.3 සංවිධාන සටහන


ලේකම්
ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය
අතිරේක ලේකම්,
(පාලන හා සංවර්ධන)
(SLAS-Sp)(01)
අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු)
(SLEngS-Sp)(01)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(SLAS-I) (01)
ප්‍රධාන ගණකාධිකාරි
(SLAcS-I) (01)
අධ්‍යක්ෂ
(SLPS-I) (01)
අධ්‍යක්ෂ (SLEngS -I) (01)
ප්‍රධාන අභ්‍යන්තර විගණන
(SLAcs) (01)
සහකාර ලේකම්
(SLAS -III/II) (01)
ගණකාධිකාරී
(SLAcS - I) (01)
සහකාර ලේකම් /
නියෝජ්‍ය අධ්‍යක්ෂ
(SLPS -III/II) (01)
ඉංජිනේරු
(SLEngS-III/II) (02)
අභ්‍යන්තර විගණන
(SLAcs -III/II) (01)
පරිපාලක නිලධාරී
සංවර්ධන නිලධාරී
කළමණාකරන සේවා නිලධාරී
කාර්යාල කාර්ය සහයක
රියදුරු
ඡායාරූප ශිල්පී
කැමරා ශිල්පී
කැමරා ශිල්පී සහයක

1.4 අනුමත කාර්ය මණ්ඩල තොරතුරු

තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	සේවා මට්ටම	අනුමත තනතුරු සංඛ්‍යාව	පවතින තනතුරු සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම							
අමාත්‍යාංශය ලේකම්			SL – 4 2016		1	1	0
අතිරේක ලේකම් (පාලන සහ සංවර්ධන)	SLAS	Spl	SL – 3 2016	Senior	1	1	0
අධ්‍යක්ෂ ජනරාල්	SLEngS	Spl	SL – 1 2016	Senior	1	0	1
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	SLAS	I	SL – 1 2016	Senior	1	0	1
ප්‍රධාන ගණකාධිකාරි	SLAcS	I	SL – 1 2016	Senior	1	1	0
අධ්‍යක්ෂ (සැලසුම්)	SLPS	I	SL – 1 2016	Senior	1	1	0
අධ්‍යක්ෂ (ඉංජිනේරු)	SLEngS	I	SL – 1 2016	Senior	1	0	1
ප්‍රධාන අභ්‍යන්තර විගනක	SLAcS	I	SL – 1 2016	Senior	1	1	0
සහකාර ලේකම්	SLAS	III/ II	SL – 1 2016	Senior	1	0	1
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ	SLPS	III/ II	SL – 1 2016	Senior	1	1	0
ඉංජිනේරු	SLEngS	III/ II	SL – 1 2016	Senior	2	0	2
ගණකාධිකාරි	SLAcS	III/ II	SL – 1 2016	Senior	1	0	1
අභ්‍යන්තර විගනක	SLAcS	III/ II	SL – 1 2016	Senior	1	0	1
සම්බන්ධීකරන ලේකම්	Temp				1	1	0
ජ්‍යෙෂ්ඨ මට්ටම එකතුව					**15**	**7**	**8**
තෘතීයය මට්ටම							
පරිපාලන නිලධාරි	Supra		MN– 7 2016	Senior	1	0	1
තෘතීයයමට්ටම එකතුව					**1**	**0**	**1**
ද්විතයීය මට්ටම							
සංවර්ධන නිලධාරී	DOS	III/ II/ I	MN– 4 2016	Secondary	23	10	13
කළමණාකරන සේවා නිලධාරී	MSOS	III/ II/ I	MN– 2 2016	Secondary	12	3	9

ඡායාරූප ශිල්පී	Temp			Secondary	1	1	0
කැමරා ශිල්පී	Temp			Secondary	1	1	0
ද්විතයීය මට්ටමඑකතුව					**37**	**15**	**22**
ප්‍රාථමික මට්ටම							
රියදුරු	DS	III/II/I spl	PL- 3 2016	Primary	5	5	0
කාර්යාල කාර්ය සහයක	OES	III/II/I spl	PL- 3 2016	Primary	5	5	0
කැමරා ශිල්පී සහයක	Temp				1	1	0
ප්‍රාථමික මට්ටම එකතුව					**11**	**11**	**0**
සම්පූර්ණ එකතුව					**64**	**33**	**31**

1.5 අමාත්‍යාංශයේ අභ්‍යන්තර සංයුතිය

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය, රාජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අංශ පහක් යටතේ ක්‍රියාත්මක වේ.

1. පාලන අංශය
2. ගිණුම් අංශය
3. සැලසුම් අංශය
4. ඉංජිනේරු අංශය
5. අභ්‍යන්තර විගණන අංශය

- පාලන අංශය අතිරේක ලේකම් යටතේ ක්‍රියාත්මක වේ.
- ගිණුම් අංශය ප්‍රධාන ගණකාධිකාරිවරයකු යටතේ ක්‍රියාත්මක වේ
- සැලසුම් අංශය අධ්‍යක්ෂ (සැලසුම්) යටතේ ක්‍රියාත්මක අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) ගේ දායකත්වය ලබා දේ.
- ඉංජිනේරු අංශය අධ්‍යක්ෂ (ඉංජිනේරු වැ.බ) යටතේ ක්‍රියාත්මක වන අතර සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) ගේ සහය එම අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා ලැබේ.

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග වැඩසටහන හා ග්‍රාමීය පාලම් සංවර්ධන වැඩ සටහන ඉංජිනේරු අංශයේ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක වේ.

පාලන අංශය

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කිරීමෙන් අනතුරුව සීමිත සේවක සංඛ්‍යාවක් සහිතව අමාත්‍යාංශයේ කටයුතු ආරම්භ විය. අතිරේක ලේකම්ගේ ප්‍රදානත්වයෙන් පාලන අංශයේ රාජකාරි කටයුතු සිදු කෙරේ.

රාජ්‍ය අමාත්‍යාංශය සියළුම පරිපාලන කටයුතු පාලන අංශයෙන් සිදුවන අතර, නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත කිරීමේදී සිදුවන අත්‍යාවශ්‍ය මූලික කටයුතු කෙරෙහි පාලන අංශයේ විශේෂ අවධානය මුල් කාලයේදී යොමු කරන ලදී. සේවා අවශ්‍යතාවයන් මත තනතුරු අනුමත කර ගැනීම්, එක් එක් අංශ සඳහා පත් කිරීම්, රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අවශ්‍ය භෞතික සම්පත් සම්බන්ධීකරණය කරමින් අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය මූලික පියවරයන් ගැනීමට පාලන අංශය සිය අවධානය යොමු කරන ලදී.

අමාත්‍යාංශයේ සියළුම පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම දරන අංශය පාලන අංශයයි. අතිරේක ලේකම්ට අමතරව පරිපාලන නිලධාරී (වැ.බ) පමණක් රාජකාරී කරන අතර, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හා සහකාර ලේකම් තනතුරු පුරප්පාඩු පවතී.

අවම කාර්ය මණ්ඩලයක් සහිතව පාලන අංශයේ රාජකාරී කටයුතු සිදුකෙරේ.

2021 වර්ෂය තුළ පැවති කොවිඩ්-19 වසංගත තත්වය තුල නිවසේ සිට රාජකාරී කිරීමටද සිදුවූ අතර, අමාත්‍යාංශයේ අනෙකුත් අංශ සමග කාර්යක්ෂමවහාඅඛණ්ඩව සම්බන්ධීකරණයක් කිරීමට ද සමත් විය.

එසේම තොරතුරු ලබාදීමේ පනත අනුව මහජනතාව වෙත තොරතුරු ලබා දීම කාර්යක්ෂමව කරන ලදී. එසේම එම තොරතුරු කඩිනමින් ලබාදීම සඳහා අදාල අංශ සමග සම්බන්ධීකරණය කිරීම පාලන අංශය මගින් සිදු කරන ලදී.

ගිණුම් අංශය

රාජ්‍ය අමාත්‍යාංශය වෙත වාර්ෂික අයවැය මගින් වෙන්වන ප්‍රතිපාදන සම්බන්ධව මෙහෙයවීම හා පාලනය කිරීමේ වගකීම ගිණුම් අංශය වෙත පැවරී ඇත. නව අමාත්‍යාංශයක් ලෙස ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කෙරුනු ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝගී කිරීමත් මහා භාණ්ඩාගාරය සමග සම්බන්ධීකරණය කරමින් අදාල මූල්‍ය වාර්තා සකස් කිරීම, අදාල ගෙවීම් කටයුතු සිදුකිරීම හා මූල්‍ය වාර්තා අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීමත් සිදු කරනු ලබයි. මෙම අංශය ප්‍රධාන ගණකාධිකාරි යටතේ ක්‍රියාත්මක වන අතර ඉතා සුළු සේවක සංඛ්‍යාවක් සහිතව ක්‍රියාත්මක වන අතර මානව සම්පත් හිඟකම මෙම අංශයද මුහුණු පා ඇති ප්‍රධාන ගැටළුවකි.

රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති, මහා මාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති, මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, මහාභාණ්ඩාගාරය හා අදාල අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය කරමින් අයවැය අරමුදල් මනා ලෙස උපයෝජනය සඳහා පහසුකම් සැපයීම කරන ලදී.

රාජ්‍ය අමාත්‍යාංශයේ බැංකු ගිණුම් අධීක්ෂණය, රාජ්‍ය ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, ඇතුළුව අනෙකුත් අමාත්‍යාංශ හා ආයතන වෙත ඉල්ලනු ලබන සියළු වාර්තා ඉදිරිපත් කිරීමට ද කටයුතු කරන ලදී.

සැලසුම් අංශය

ග්‍රාමීය මාර්ග රාජ්‍ය අමාත්‍යාංශයේ අරමුණු ළඟා කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සහ සම්බන්ධීකරණය මෙම අංශය මගින් ඉටු වේ. අධ්‍යක්ෂ (සැලසුම්) යටතේ ක්‍රියාත්මක වන සැලසුම් අංශය රාජ්‍ය අමාත්‍යාංශයට අදාලව 2021 වසර සඳහාසැලසුම් සකස් කරන ලද අතර, 2021 වර්ෂයට අදාල ප්‍රගති වාර්තාව සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

එසේම කාර්තුමය ප්‍රගති වාර්තා අදාල ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.

ග්‍රාමීය මාර්ග අමාත්‍යාංශයේ සංවර්ධන වැඩ සටහන් පිළිබඳව ප්‍රගති වාර්තාවන් මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාල වෙත ඉදිරිපත් කරන ලදී.

රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ග්‍රාමීය මාර්ග වැඩ සටහන 2021 වසරේ ක්‍රියාත්මක කිරීම සැලසුම් අංශය හා ඉංජිනේරු අංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලදී. සියළුම පළාත් පාලන ආයතන දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලද අතර ව්‍යාපෘති අනුමත කිරීම්, ප්‍රගති සමාලෝචනය ක්ෂේත්‍ර රාජකාරී ද බිල්පත් ගෙවීමේ කටයුතු වලටද සෘජුව සහභාගීත්වය දෙන ලදී.

ඉංජිනේරු අංශය

අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂ (ඉංජිනේරු) වැ.බ යටතේ ක්‍රියාත්මක වන ඉංජිනේරු අංශය වෙත ග්‍රාමීය මාර්ග හා ග්‍රාමීය පාලම් ඉදිකිරීම සම්බන්ධ තාක්ෂණික හා ඉංජිනේරුමය වගකීම් පැවරී ඇත.

ග්‍රාමීය මාර්ග සංවර්ධනය, පාලම් සංවර්ධන ව්‍යාපෘතිය හා මාර්ග දෙපස පැල සිටුවීමේ වැඩ සටහන යන ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් වලට අදාලව ව්‍යාපෘති හඳුනා ගැනීම, තාක්ෂණික ඇගයීම්, ක්‍රියාත්මක කිරීමේ කටයුතු, ප්‍රගතිය අධීක්ෂණය, නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය,බිල්පත් ගෙවීමට අදාලව තාක්ෂණික නිර්දේශයන් ලබා දීම මෙම අංශය මගින් ඉටු කරන ලදී.

පාලම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යෝජනා කැඳවීම, දත්ත පද්ධතිය පවත්වාගෙන යාම, සංවර්ධන ව්‍යාපෘති වල ගෙවීම් කටයුතු වල නිර්දේශයන් සහ අනුමැතීන් ලබා දීම, මාර්ග සංවර්ධනය සඳහා වන ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම, පාලම් සංවර්ධනය සඳහා ලැබී ඇති ඉල්ලීම් අතරින් නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඒවා අධීක්ෂණය ඉංජිනේරු අංශය මගින් සිදු කරන ලදී.

මෙයට අමතරව ග්‍රාමීය මාර්ග සංවර්ධන අවශ්‍යතාවය පිලිබඳ තොරතුරු එක්රැස් කිරීම, දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම, විවිධ ආයතන හරහා ග්‍රාමීය මාර්ග ක්ෂේත්‍රයට අදාලව ලැබී ඇති සංවර්ධන ඉල්ලීම් සඳහා ඉදිරි කටයුතු සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීමට අදාල ක්‍රියාමාර්ග ගැනීම ආදී කටයුතු ද සිදු කරනු ලබයි.

ක්‍රියාත්මක කෙරෙන ග්‍රාමීය පාලම් හා ග්‍රාමීය මාර්ග වල අධීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලද අතර අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මග පෙන්වීම් ඉංජිනේරු අංශය මගින් කරන ලදී.

ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ජංගම දුරකථන මෘදුකාංග හඳුන්වාදීම හා වෙබ් අඩවි නිර්මාණය කිරීම ඉංජිනේරු අංශය මගින් කරන ලද අතර, එමගින් අදාල කාලයන්ට අනුරූපීව අධීක්ෂණය කිරීමේ හැකියාව තහවුරු කිරීම බලාපොරොත්තු වේ.

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය රාජ්‍ය අමාත්‍යාංශයේ ස්ථාපිත කරන ලද නව අංශයයි. මූල්‍ය රෙගුලාසි අංක 128 හි දැක්වෙන පරිදි ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මූල්‍ය රෙගුලාසි අංක 133 දැක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් 2021 සැප්තැම්බර් මස පිහිටුවන ලදී.

2021 වසර සඳහා කාර්ය සාධන, මූල්‍ය හා ආයතන විගණනයන් සිදු කර විගණන වාර්තා ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. එසේම අවසන් කාර්තුව තුළ විගණන හා කළමණාකරන රැස්වීමක් පවත්වන ලදී.

අභ්‍යන්තර විගණන අංශය 2021 වසරේ අවසන් කාර්තුව තුළ ස්ථාපිත වූ බැවින් හා අභ්‍යන්තර විගණක හැර වෙනත් කාර්ය මණ්ඩලයන් නොසිටි බැවින්, අපේක්ෂිත ඉලක්කයන් සම්පූර්ණ කර ගැනීමට නොහැකි විය.

1.6වෙනත් ව්‍යවස්ථාපිත ආයතන

1.6.1 රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (SD&CC)

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව ග්‍රාමීය මාර්ග හාඅවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයක් බවට ප්‍රකාශයට පත් කර ඇත.

රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තවයන් අතර ප්‍රමුඛතා කාර්යන් වන ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය හා නවීකරණය කිරීම සහ මාර්ග ජාලය හා බැඳුනු පාලම් පද්ධතිය නවීකරණය කිරීමේ කටයුත්ත සඳහා රාජ්‍ය සංවර්ධන සහා නිර්මාණ නීතිගත සංස්ථාවේ උපරිම දායකත්වය ලබා ගැනීමට අපේක්ෂිතය.

1957 අංක 49 දරණ කර්මාන්ත සංයුක්ත මණ්ඩල පනතට අනුව මහා පරිමාණ සිවිල් ඉංජිනේරුමය කොන්ත්‍රාත් කටයුතු කිරීම සඳහා 1971 වර්ෂයේදී රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පිහිටුවා තිබේ. සංස්ථාවේ එකම කොටස්කරු වශයෙන් කටයුතු කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයයි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පාලම්, මහා මාර්ග, ජලාශ, වාරිමාර්ග පද්ධති, ජල විදුලි බලාගාර, උමං හා ඇල මාර්ග, ජල සැපයීම ව්‍යාපෘති , ගොඩනැගිලි හා කැලෑ එළි පෙහෙළි කිරීම හා ඉඩම් සැකසීම යන ඉංජිනේරුමය කාර්යයන්හි නිරතව සිටී.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදන අයිතම් වල සිට පෙරසවි කොන්ක්‍රීට් පාලම් කදම්බ (BEAMS) , සම්ප්‍රේෂණ කුළුණු සහ දුම්රිය පාකඩ (Railway Sleepers) දක්වා වන සියලුම කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදනයේ පුරෝගාමී ආයතනයකි.

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව රටේ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයේ ක්‍රියාකාරීව සම්බන්ධ වෙමින් ජාතික ආර්ථිකයට සෘජුවම දායකත්වය ලබාදෙන අතර, මීට අමතරව රජයේ කිසිම ආධාරයක් නොමැතිව ඉංජිනේරුවරුන් හා අනෙකුත් තාක්ෂණික ශිල්පීන් පුහුණුව තුළින් ද ඉදිකිරීම් ක්ෂේත්‍රයට හා පොදුවේ රටට මිල කළ නොහැකි සේවාවක් සපයයි.

ආයතනයේ ඉදිරි දැක්ම, ගමන් මග හා අරමුණු (SD&CC)

ඉදිරි දැක්ම

ජාතික ආර්ථිකයට වටිනාකම් එකතු කරන යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු හොඳම ආයතනය වීම.

ඉදිරි ගමන්මග

ජාතික යටිතල පහසුකම් සංවර්ධනය හා විවිධ ඉදිකිරීම් කටයුතු වලට සහභාගී වීම හා එම කටයුතු ඉහලම තත්වයෙන් කරගෙන යෑමත් මගින් රටේ ආර්ථික සංවර්ධනයට උදව් කිරීම හා සිවිල් ඉංජිනේරුමය ඉදිකිරීම් හා පෙර සවි/ පෙරනිමි කොන්ක්‍රීට් භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍ර වල වෙළඳ පොළ පෙරගමන්කරු වීම.

අරමුණු

1. ලංකාව තුළ හෝ විදේශයකදී ඕනෑම පාර්ශවයකට අයිති ගොඩනැගිලි සිවිල් ඉංජිනේරුමය කාර්යයන්, අනෙකුත් ඉංජිනේරුමය ව්‍යාපෘති හෝ අනෙකුත් ව්‍යාපාර තනිව හෝ අනෙකුත් එවැනි ආයතනයක් පවරා ගැනීමෙන් හෝ කොටස් ලබා ගැනීමෙන් විමර්ශනය, ආයොජන, සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම.
2. ඉංජිනේරුමය කාර්යයන් සඳහා අවශ්‍ය කොන්ක්‍රීට්, වැරගැන්වූ හා පෙරසවි කොන්ක්‍රීට් දේශීයව හෝ විදේශීය නිෂ්පාදනය හා අලෙවි කිරීම.
3. ඉංජිනේරුමය ව්‍යාපෘති සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය උකහා ගැනීම සහ ඉංජිනේරු ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍ර සූත්‍ර අමුද්‍රව්‍ය නිෂ්පාදනය, අලෙවි කිරීම, ආනයනය සහ අපනයනය කිරීම.
4. ඉහත සඳහන් කාර්යයන් සඳහා අවශ්‍ය ඉදිකිරීමේ ද්‍රව්‍ය, ක්‍රම සහ උපයෝගී කරගන්නා තාක්ෂණික සම්බන්ධ පර්යේෂණ කිරීම සහ ඒ සඳහා අවශ්‍ය වන කළමනාකාරීත්ව දැනුම, කුසලතාවය හා නවීන තාක්ෂණික දැනුම යනාදිය. කළමනකරුවන්ට/ ඉංජිනේරුවරුන්ට/ තාක්ෂණික නිලධාරීන්ට/ පුහුණුවීමේ අවස්ථා මගින් ලබාදීම.
5. ශක්තිමත් ස්වයං මූල්‍ය හැකියාවක් ඇති ආයතනයක් වශයෙන් පවත්වා ගැනීම
6. 10%අවම ලාභාන්තිකය පවත්වා ගනිමින් ජව්‍ය ආයතනයක් වීම.
7. 30% පිරිවැටුම් වර්ධකයක් ළඟාකර ගැනීම.
8. අවදානම හඳුනාගැනීම හා ක්‍රමානුකූලව කළමනාකරණය කිරීම

1.6.2 ග්‍රාමීය පාලම් අංශය

මහා මාර්ග අමාත්‍යාංශය යටතේ වන ව්‍යවස්ථාපිත ආයතනයක් වන මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ග්‍රාමීය පාලම් අංශය ක්‍රියාත්මක වේ. එම අංශයේ පලපුරුද්ද සහ අත්දැකීම් දායක කර ගැනීම තුලින් රාජ්‍ය අමාත්‍යාංශයේ පාලම් සංවර්ධන කටයුතු කඩිනමින් මෙන්ම කාර්යක්ෂමව කිරීමේ හැකියාව ඇති බැවින් එම අංශයේ දායකත්වය ලබාගෙන තෝරාගත් පාලම් සංවර්ධන කාර්යය ඉටුකර ගැනීම සිදුකරනු ලබයි.

ග්‍රාමීය පාලම් සංවර්ධනය සඳහා අවශ්‍ය වන ඇස්තමේන්තු සහ නිර්මාණ සකස් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබන අතර සංවර්ධන කටයුතු කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම මගින් ඉටු කරනු ලබයි.

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරිදැක්ම

2.0 කාර්ය සාධනය, ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සංවර්ධනවැඩසටහන්හි කාර්ය සාධනය

1. ජනතාවගේ ප්‍රවේශ අවශ්‍යතාවයන් සපුරමින්, ග්‍රාමීය ජනතාවගේ සමාජ ආර්ථික දියුණුව වැඩිදියුණු කිරීමට පාදක වන සහ සහසම්බන්ධිත ග්‍රාමීය මාර්ග ජාලය වැඩි දියුණු කිරීමේ අරමුණින් අංක 2187/27 දරන 2020.08.08 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මගින් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කෙරුණි.
2. රටේ සමස්ථ මාර්ග පද්ධතියෙන් වැඩි ප්‍රතිශතයක් ලෙස හඳුනාගත හැකි ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධන කිරීම පිළිබඳව මහා මාර්ග අමාත්‍යාංශය යටතේ පැවති දශක එක හමාරක පමණ කාර්යභාරය තවදුරටත් පුළුල් කරමින්, ඒ සඳහා වෙනම රාජ්‍ය අමාත්‍යාංශයක් ඇති කිරීමතවදුරටත් ග්‍රාමීය මාර්ග සංවර්ධනයේ අවශ්‍යතාවය සහ වැදගත්කම ඉස්මතු කරන්නකි.
3. 2022 වසර සඳහා අයවැය ප්‍රතිපාදන මඟින් ග්‍රාමීය මාර්ග රු.මි. 15,497 ක් ද ග්‍රාමීය පලම් සඳහා රු.මි. 9500 ක් ද අනුමත විය. එසේම මහාමාර්ග අමාත්‍යාංශයෙන් රු.මි. 20,000 ක අතිරේක ප්‍රතිපාදන මුදලක්ද ලැබුනි. ඒ අනුව 2021 වසරේ වැඩ සටහන් පහත සඳහන් ප්‍රමුඛතාවයන්ට අනුගත වන පරිදි සැලසුම් කරන ලදී.
4.
   I. ග්‍රාමීය මාර්ග ජාලය සංවර්ධනය හා නවීකරණය
   II. මාර්ගය ජාලය හා බැඳුණු පාලම් පද්ධතිය නවීකරණය කිරීම.
   III. මාර්ග දෙපස සෙවන ශාක සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
   යන වැඩසටහන් සඳහා සැලසුම් සකස් කිරීම සිදුවිය.
5. කොවිඩ් - 19 වසංගත තත්වය තුළ රට වසා දැමීම හා සමාජ දුරස්ථභාවය පිළිබඳව අවධානයක් ද යොමු කළයුතු වූ බැවින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ යම් පසු බෑමක් ඇතිවිය. එහෙත් සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව යමින් වැඩ සටහන් ක්‍රියාත්මක කළද අමුද්‍රව්‍ය හිඟය හා අමු ද්‍රව්‍ය මිල ඉහල යෑම හේතුවෙන් භෞතික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි බාධාවන් ඇති විය. එබැවින් භෞතික ප්‍රගතිය අවම මට්ටමකට ඇති බව වාර්තා විය. එසේම ප්‍රමාණවත් පරිදි අක් මුදල් මහා භාණ්ඩාගාරයෙන් නොමැතිව නිසා මූල්‍ය ප්‍රගතියද අවම මට්ටමක පැවතිනි.

2.1.1 ඒ දඬු පාලම් වැල් පාලම් වෙනුවට කුඩා පාලම් ඉදිකිරීම

රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත වූ 2020 වසරේ අවසන් කාර්තුව තුල අමාත්‍යාංශයේ මූලික අවධානයක් යොමු වූ ව්‍යාපෘතියක් වූයේ ඒ දඬු පාලම් හා වැල් පාලම් වෙනුවට කුඩා පාලම් ඉදිකිරීමේ වැඩසටහනයි. එම වැඩසටහන සඳහා එම වසරේ ක්‍රියාත්මක වූ නියමු ව්‍යාපෘතිය අනුව පැහැදිලි වූ කරුණක් වූයේ කුඩා වාහන ගමන් කළ හැකි පාලම් සඳහා ජනතාවගේ වැඩි ඉල්ලීමක් ඇති බවයි. ඒ අනුව සැහැල්ලු වාහන ගමන් කළ හැක පාලම් ඉදි කිරීම කෙරෙහි 2021 වසරේදී වැඩි අවධානයක් යොමු කරන ලදී.

ඒ අනුව 2021 වසරේ අයවැය මඟින් වෙන්වූ රු.මි. 9500.00 යොදවමින් ග්‍රාමීය පාලම් ඉදි කිරීමේ වැඩ සටහන ආරම්භ කරන ලදී.

පළමු අදියර යටතේ පාලම් 160 ක් ද දෙවන අදියර යටතේ පාලම් 175 ක් ද තෝරා ගත් අතර 2021 දෙසැම්බර් 31 දින වන විට පාලම් 100 ක් සංවර්ධන කටයුතු අවසන්ව ඇත.

2.1.2 ග්‍රාමීය පාලම් වැඩ සටහන - මාර්ග සංවර්ධන අධිකාරිය

2020/21 වර්ෂයේ ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ වැඩසටහන ආරම්භ කෙරින. මෙම වැඩසටහනේ ප්‍රධාන ව්‍යාපෘතිය 2020/21 වර්ෂයේ ග්‍රාමීය පාලම් ප්‍රධාන වැඩසටහනේ සියලුම පාලම් නිර්මාණ හා ඇස්තමේන්තු සකස් කිරීම මාර්ග

සංවර්ධන අධිකාරිය හරහා ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ කොන්ත්‍රාත්කරුවන්ට පිරිනමන ලදී. එම අදියරයේද වැඩ ක්‍රියාත්මක වෙමින් පවතී. දෙවන අදියරය නැවතත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා රාජ්‍ය සංවර්ධන හා නීතිගත සංස්ථාව වෙත ප්‍රදානය කරන ලදී. තවද මාර්ග සංවර්ධන අධිකාරියේ ග්‍රාමීය පාලම් අංශය හරහා තවත් ග්‍රාමීය පාලම් ඉදිකරවා ගැනීම සිදුකරන ලදී. මීට අමතරව මාර්ග සංවර්ධන අධිකාරිය හා රාජ්‍ය සංවර්ධන හා නීතිගත සංස්ථාව මගින් ඉවතලන විදුලි කණු භාවිතා කරමින් පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදී.

2.1.3 මහා මාර්ග දෙපස පැල රෝපණය කිරීමේ වැඩසටහන

2020/21 වර්ෂයේ ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ එක් ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස මග දෙපස තුරු සෙවන සුරැකුමට පරිසරය නම් තේමාව යටතේ මහා මාර්ග දෙපස හා පොදු ස්ථානවල ගස් මිලියන 2ක් සිටුවීමේ ව්‍යාපෘතිය ඉලක්කය සපුරා ගැනීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ මහජනතාව සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් පවතී.

විනිවිදභාවයෙන් සහ පහසු ආකාරයෙන් දිවයිනේ ඕනෑම තැනක ගස් සිටුවීම සහ නිරීක්ෂණය කිරීමට ඕනෑම කෙනෙකුට ඉඩ සැලසීම සඳහා රුක් රෝපණ වැඩසටහන සඳහා සංවර්ධිත ජංගම යෙදුමක් සහ වෙබ් අඩවියක් ක්‍රියාත්මක වේ.

ප්‍රධාන වැඩ සටහන මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර අනෙකුත් සංවිධාන සමඟ සහයෝගීතා වැඩසටහන් ලෙසද මෙම වැඩ සටහන ක්‍රියාත්මක කෙරේ. රුක් රෝපණ වැඩසටහන රාජ්‍ය අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

2021 වර්ෂයේදී පමණක් මාර්ග සංවර්ධන අධිකාරියේ සහයෝගය සහ අනෙකුත් සිවිල් සංවිධාන සහයෝගය සහිතව ගස් 68,000කට අධික ප්‍රමාණයක් සිටුවා නඩත්තු කටයුතු අධීක්ෂණය කරමින් සිටී.

2.1.4 මුහුණදුන් ගැටළු හා අභියෝග


1. කොවිඩ්-19 වසංගත තත්වය නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවූ බාධාවන්.
2. අමුද්‍රව්‍ය මිල ඉහල යාම හා වෙළඳපලේ අමුද්‍රව්‍ය හිඟයක් පැවත්ම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාදවීම නිසා නියමිත කාලය තුල ව්‍යාපෘති අවසන් කළ නොහැකි වීම.
3. ඇතැම් අමුද්‍රව්‍ය සපයා ගැනීම ප්‍රවාහනය කිරීම වැනි කරුණු සඳහා සඳහා අවසර ලබා ගැනීමේ ක්‍රියාවලියේ පවතින ප්‍රමාදයන් සීමාවන් නිසා ඇතිවෙන ගැටලුකාරී තත්ත්වයන් ,(ද්‍රව්‍ය මිල ඉහළ යෑම/ ප්‍රමාදයන්)
4. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් අනුමත ප්‍රජා සංවිධාන යාවත්කාලීන නොවීම සහ සංශෝධනය නොවීම නිසා පවතින ගැටළු.
5. වැඩ අවසන් කළ ව්‍යාපෘති සඳහා ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම නිසා මූල්‍ය ප්‍රගතිය අවම වීම.

2.2 අයවැය ප්‍රතිපාදන 2021 - ආයෝජන සැලැස්ම

වගු අංක 2.2.1 අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම, සංවර්ධන සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්

වැය ශීර්ෂය	විස්තරය	මූලාශ්‍රය	ප්‍රතිපාදන (රු.මි.)		ප්‍රතිශතය (%)
			මුදල	මුළු මුදල	
	1) සංවර්ධන ක්‍රියාකාරකම්				
435-2-3-001-2506	I. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන	අයවැය ප්‍රතිපාදන	15,497	35,497.0	78.75 %
		අමතර ප්‍රතිපාදන	20,000		
435-2-2-002-2506	II. ග්‍රාමීය පාලම් ඉදිකිරීම සහ සංවර්ධනය කිරීම	-	9,500		21.08 %
	2) මෙහෙයුම් ක්‍රියාකාරකම්				
435-02-01	I. අමාත්‍ය කාර්යාලයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්	පුනරාවර්ථන	34.78	76.6	0.17%
		ප්‍රාග්ධන	2.00		
435-01-02	II. අමාත්‍යාංශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්	පුනරාවර්ථන	38.55		
		ප්‍රාග්ධන	1.30		
එකතුව			**45073.60**		

සංවර්ධන මෙහෙයුම් හා ක්‍රියාකාරකම්




රූප සටහන 2.2.1 සංවර්ධන සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් - 2021

2.3ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන - 2021 දෙසැ. 31 දිනට

වගු අංක 2.3.1 මූල්‍ය ප්‍රගතිය

ක්‍රියාත්මක ආයතන මට්ටමින්	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි.)	වියදම (2021.12.31 දිනට) (රු.මි.)	අතැති බිල්පත්වටිනාකම (රු.මි.)	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති වටිනාකම	
					රු.මි	%
පලාත් පාලන ආයතනය	24,028	21,098	257	3,747	3,684	17.46
මාර්ග සංවර්ධන අධිකාරිය	6,501	9,428	250	980	840	8.9
ප්‍රාදේශීය ලේකම් කාර්යාල	8,189	8,208	227	1,202	1,425	17.36
එකතුව	38,718	38,734	734	5,929	5,949	15.35

(මහාමාර්ග අමාත්‍යාංශයෙන් ලබාදෙන ලද රු.මි. 20,000 ක අමතර ප්‍රතිපාදන ද ඇතුළුව)




රූප සටහන 2.3.1 මූල්‍ය ප්‍රගතිය, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩ සටහන 2021 දෙසැ. 31

2.4භෞතික හා මූල්‍ය ප්‍රගතිය, ග්‍රාමීය පාලම් වැඩ සටහන


වගු අංක 2.4.1 භෞතික ප්‍රගතිය - ග්‍රාමීය පාලම් වැඩ සටහන 2021 දෙසැ. 31 දිනට

ක්‍රියාත්මක ආයතනය 2020 වර්ෂය	**ප්‍රතිපාදන නිදහස් කිරීම (රු.මි.)**		**අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව**	**ව්‍යාපෘති සංඛ්‍යාව**			
	2020 වර්ෂය	**2021 වර්ෂය**		**කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද**	**වැඩ ආරම්භ කරන ලද**	**වැඩ කරමින් පවතින**	**වැඩ අවසන් කරන ලද**
කුඩා පාලම් ඉදිකිරීම 1. ග්‍රාමීය පාලම් අංශය	22.3	13.3	11	11	-	5	6
2. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව	94.3	57	22	22	1	6	15
එකතුව	116.3	70.3	33	33	1	11	21
වාහන ධාවනයට සුදුසු පාලම් ඉදිකිරීම 1. ග්‍රාමීය පාලම් අංශය (RDA)	100	813	100	-	-	56	44
2. අවිච්ඡේද 2021.1.1 දිනට 3. රාජ්‍ය සංවර්ධන හා නිර්මාන නීතිගත සංස්ථාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය	-	6533	437	-	-	403	34
එකතුව	100	7346	537			459	78
මුළු එකතුව	**216.3**	**7416.3**	**570**	**33**	**1**	**470**	**99**


500
450
400
350
300
250
200
150
100
50
0
කොන්ත්‍රාත් පිරිනමන ලද
වැඩ ආරම්භ කරන ලද
වැඩ කෙරෙමින් පවතින
වැඩ අවසන්
වාහන ධාවනය නොවන කුඩා පාලම් සංවර්ධනය
වාහන ධාවනය වන කුඩා පාලම් සංවර්ධනය

පරිච්ඡේදය 03

සමස්ථ මූල්‍ය කාර්ය සාධනය



ඒසිස්-එප්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	2021 රු.	2020 රු.	
-	ආදායම් ලැබීම්			-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිස්-1
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4		-	
-	මුළු ආදායම් ලැබීම් (අ)			-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,663,964,900	3,200,102,000.00	ඒසිස්-3
-	කැන්පතු		34,370,003	49,085,929.00	ඒසිස්-4
-	අත්තිකාරම් ගිණුම්		2,142,039	697,518.00	ඒසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	181,012.00	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		1,700,476,942	3,250,066,459.00	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		1,700,476,942	3,250,066,459.00	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ඉද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		-	-	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්			-	
43,592,449.52	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලා	5	43,581,885	9,695,991.00	
30,135,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	28,323,772	5,362,157.00	ඒසිස්-2(ii)
2,493,718.20	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,155,522	422,954.00	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
76,221,167.72	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		73,061,180	15,481,102.00	
			-		
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
2,250,000.00	වැඩිදියුණු කිරීම්	10	1,502,150	211,000.00	
850,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	839,873	2,454,659.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12		-	ඒසිස්-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
200,000.00	හැකියා වර්ධනය	14	11,800	38,969.00	
-	වෙනත් මූලධන වියදම්	15	1,871,167,657	4,914,521,351.00	
3,300,000.00	මුළු මූලධන වියදම් (උ)		1,873,521,481	4,917,225,979.00	
	කැන්පතු ගෙවීම්		10,961,588	5,229,938.00	ඒසිස්-4
	අත්තිකාරම් ගෙවීම්		2,689,936	-	ඒසිස්-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		13,651,524	5,229,938.00	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,960,234,184	4,937,937,019.00	
79,521,167.72	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(259,757,242)	(1,687,870,560.00)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(259,757,242)	-	ඒසිස්-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසිස්-3
			(0)	-	

1

ඒඑස්ඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්ෂ 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඑස්ඒ-6	816,873	2,454,659
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඑස්ඒ-5/5(ඒ)	5,080,317	4,532,421
මුදල් හා මුදල් සමාන දෑ	ඒඑස්ඒ-3	-	385,000
මුළු වත්කම්		**5,897,190**	**7,372,080**
ඉදිරි වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ඉදිරි වත්කම්		(67,414,024)	(44,553,505)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		816,873	2,454,660
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඑස්ඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒඑස්ඒ-4	72,494,341	49,085,925
අග්‍රිම ශේෂය	ඒඑස්ඒ-3	-	385,000
මුළු වගකීම්		**5,897,190**	**7,372,080**

පිටු අංක.....සිට ..... දක්වා ඒඑස්ඒ 1 සිට ඒඑස්ඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..... සිට ..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දින්ස්ටී. ඩබ්. ආර්. පේමසිරි
ලේකම්
මහාමාර්ග අමාත්‍යාංශය
08 වන මහල, "මගනැගුම මහාමිදුර"
අංක. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුවේ මාවත,
බත්තරමුල්ල.

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :
Professor Ranjith Dissanayake
Secretary
State Ministry of Rural Roads & Other Infrastructure
No. 216, "Maganeguma Mahamedura"
Denzil Kobbekaduwa Mawatha,
Koswatta, Battaramulla.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :
ඒ.පී.එස්.පී. විජේරත්න
ප්‍රධාන ගණකාධිකාරි
ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය
07 වන මහල, "මගනැගුම මහාමිදුර"
අංක. 216, ඩෙන්සිල් කොබ්බෑකඩුවේ මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර		
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	31,287,413	181,012
අග්‍රිම ලැබීම්	1,663,964,900	3,200,102,000
අත්තිකාරම් අයකර ගැනීම්	2,510,626	
තැන්පතු ලැබීම්	34,370,003	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	1,732,132,942	3,200,283,012
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	43,581,885	9,978,475
සහනාධාර සහ මාරුකිරීම්	29,479,294	245,924
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්		
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	385,000	
අත්තිකාරම් ගෙවීම්	2,454,646	
තැන්පතු ගෙවීම්	10,961,588	69,018,926
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	86,862,413	79,243,325
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	1,645,270,529	3,121,039,687
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී		
ලාභාංශ		
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්		
උප ණය අයකර ගැනීම්	-	
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	231,477
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	1,645,655,529	3,120,543,503
අත්තිකාරම් ගෙවීම්		345,485
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	1,645,655,529	3,120,888,988
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(1,645,655,529)	(3,120,657,511)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(385,000)	382,176
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්		
විදේශීය ණය ගැනීම්		
ප්‍රදානයන් ලැබීම්		
තැන්පත් ලැබීම්		2,825
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	2,825
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්		
විදේශීය ණය ආපසු ගෙවීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	2,825
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(385,000)	385,000
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	385,000	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.0 කාර්ය සාධන දර්ශක

ග්‍රාමීය මාර්ග හා ඊට සම්බන්ධිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ස්ථාපිත කරන ලද ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජය අමාත්‍යාංශයේ කාර්ය සාධනය මැන බැලීම සඳහා ප්‍රධාන කාර්ය දර්ශක කිහිපයක් හඳුනාගෙන ඇත. ඒ අනුව සෑම වර්ෂයකම රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධනය මැන බැලීම අපේක්ෂා කෙරේ.

හඳුනාගත් කාර්ය සාධක දර්ශක

1. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන

I. අනුමත කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව
II. නිම කරන ලද ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව
III. සංවර්ධනය කරන ලද ග්‍රාමීය මාර්ග කි. මීටර් සංඛ්‍යාව
IV. නිම කරන ලද නිර්මිත සංඛ්‍යාව (බෝක්කු, පැතිකාණු ... ආදිය)

2. ග්‍රාමීය පාලම් වැඩ සටහන

I. නිම කරන ලද ග්‍රාමීය පාලම් සංඛ්‍යාව

4.1 අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය සාධක දර්ශකයන්හි ප්‍රගතිය

I. ග්‍රාමීය මාර්ග වැඩ සටහන සඳහා අයවැය ප්‍රතිපාදන යටතේ රු.මි. 15,497.00 ක් ද මහාමාර්ග අමාත්‍යාංශයෙන් රු.මි. 20,000.00 ක් ද ලැබුනු අතර අනුමත සමස්ථ ප්‍රතිපාදන මුදල වූ රු.මි. 35,497.00 සඳහා ව්‍යාපෘති 38,718 ක් අනුමත කරන ලදී. ඒ අනුව 100% ක ප්‍රගතියක් ඇත.
II. අනුමතකරන ලද මුළු ව්‍යාපෘති ගණන 38,728 ක් වූවද 2021.12.31 දිනට වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත් කර ඇත්තේ. මාර්ග 6681ක පමණි. එය සියයට 16.70 ප්‍රතිශතයක් පමණී.
III. අපේක්ෂිත දුර ප්‍රමාණය කි.මී. 2839 ක් වුවද, වැඩ අවසන් කරන ලද්දේ කි.මී. 468.25 දුර ප්‍රමාණයක් පමණි.
IV. නිර්මිත සංවර්ධනයද අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගත නොහැකි විය.
වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති වල බිල්පත් නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම මූල්‍ය ප්‍රගතිය අඩු මට්ටමක පැවතීමට හේතු වී ඇත.

ග්‍රාමීය පාලම් 570 ක් අනුමත කරනු ලැබූවද වැඩ අවසන් කර ඇත්තේ පාලම් 99 ක් පමණි, ඇතැම් පාලම් වල ව්‍යාපෘති කාලය වසර 1-3 දක්වා වන වන බැවින් අර්ධ වශයෙන් සම්පූර්ණ වන සංඛ්‍යාවක්ද මෙයට ඇතුලත් වේ.

2021 වසර තුළ පාලම් 570 ක් නිම කිරීමට සැලසුම් කළද පැවති මූල්‍යමය බාධාවන්, අමු ද්‍රව්‍ය හිඟය, අමුද්‍රව්‍ය මිල වරින් වර ඉහල යාමද කොවිඩ් 19 වසංගත තත්වයද හේතුවෙන් පාලම් ව්‍යාපෘති 99 ක් පමණක් අවසන් කිරීමට හැකිවිය. එය 17%ප්‍රතිශතයකි.

4.1 රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශකයන්හි ප්‍රගතිය

	කාර්ය සාධනය	සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස		
		100% - 90%	89% - 75%	74% - 50%
I	නිමකරන ලද නව ග්‍රාමීය පාලම් සංඛ්‍යාව			√
II	මහාමාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහන් සංඛ්‍යාව			√
III	ග්‍රාමීය මාර්ග කි.මී. සංඛ්‍යාව			√

පරිච්ඡේදය 05

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

05. තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය

ලෝකයේ සියලුම රටවල් එකසත් ජාතීන්ගේ තිරසර සංවර්ධන සමුළුවේදී (2015) දී සම්මත කරගනු ලැබූ තිරසර සංවර්ධන අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට කැප වී සිටී. අරමුණු 17ක් ඉලක්ක 169 ක් හා දර්ශක 244 කින් සමන්විත තිරසර සංවර්ධන අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ජාතික අයවැය ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා සියලුම ආයතන ක්‍රියා කරමින් සිටී.

2030 වන විට සියලුම රාජ්‍ය ආයතන තිරසර සංවර්ධන අරමුණු මුදුන්පත් කර ගැනීමට අපේක්ෂා කරන බැවින් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය ද ග්‍රාමීය මාර්ග අංශයට අදාළව අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ඇත.

අරමුණු අංකය	ඉලක්කය	දර්ශකය	2020.12.31 දිනට ප්‍රගතිය		
			0–49%	50–74%	75–100%
09	ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියළු දෙනාටම ලබාගත හැකිවීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශ සීමාවන් අතළු සිදු කරන යටිතල පහසුකම් ද ඇතුලත්ව ගුණාත්මක වශයෙන් ඉහල විශ්වාසදායි තිරසර සහ අපාදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන පාලම් සංඛ්‍යාව හා මාර්ග කි.මී. ගණන	√		
11	විශේෂයෙන්ම අවදානයට ලක්විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, අබාධ සහිත පුද්ගලයන් සහ වයස්ගත පුද්ගලයන්ට විශේෂ අවදානය යොමු කරමින් මහා මාර්ග වල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමකින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විට සියලු දෙනාට ආරාක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශ විය හැකි හා තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම.	මාර්ග අනතුරු අවම කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද තිරසර පරිසර කළමණාකර ව්‍යාපෘති සංඛ්‍යාව	√		

පරිච්ඡේදය 06

මානව සම්පත් කළමණාකරණය

6. මානව සම්පත් කළමණාකරණය

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව තුල ජේෂ්ඨ, ද්විතීයක හා ප්‍රාථමික මට්ටම්වලතනතුරු පුරප්පාඩු 27ක් පැවතිනි. 2021 වසර පුරාම සියළුම අංශ වල පුරප්පාඩු පැවති අතර, කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට ළඟා කර ගැනීමට නිළධාරී හිඟයද එක් හේතුවක් විය. ඊට අමතරව පුහුණු පදනම යටතේ උපාධිදාරී නිළධාරීන් ද පරිසණක යෙදවුම් සහයකවරුන් (බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය) යටතේ පුහුණුව සඳහා 04 දෙනෙකු ලැබුනු අතර, මෙම තාවකාලික නිළධාරීන්ද යොදවා රාජකාරී කටයුතු කළමණාකරනය කර ගන්නා ලදී.

තනතුර	**අනුමත තනතුරු සංඛ්‍යාව**	**පවතින තනතුරු සංඛ්‍යාව**	**පුරප්පාඩු**
ජෙය්ෂ්ඨ මට්ටම	15	7	8
තෘතීයික මට්ටම	1	0	1
ද්විතයීය මට්ටම	37	15	22
ප්‍රාථමික මට්ටම	11	11	0
සම්පූර්ණ එකතුව	**64**	**33**	**31**

6.1 මානව සම්පත් සංවර්ධනය

වැඩ සටහනේ නම	පුහුණු කරන ලද සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයොජනය	වැඩ සටහනේ ස්වභාවය දේශීය/ විදේශීය	නිමවුම/ ලබාගත් දැනුම

★ කොවිඩ් -19 වසංගත තත්වයන් යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
01	**මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ.**	අනුකූල වේ ඉදිරිපත් කර ඇත.		
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ ඉදිරිපත් කර ඇත.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල වේ		
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	අදාලනොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	අදාලනොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.6	වෙනත්			
2.0	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**	අනුකූල වේ		
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ. (චෙක්පත් සඳහා පමණි)		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20)යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
5	**විගණන විමසුම්**			
5.1	ඒ.ගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	ඡ්.රෙ. 134(2)DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට බදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව , එම චක්‍රලේඛයේ විධී විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගනකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂනයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	නහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103 ,104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්න අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(I) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල නොවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පත් ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම්**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**අදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	අදාල ආදායම් ශීර්ෂය වලට බැර කර ඇත.	
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම	අනුකූල නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSDචක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැන ගැනීම පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතන පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතන පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සකසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රාකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (I) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල නොවේ	බොහෝ සේවා දායකයන් අභ්‍යන්තර ගණුදෙනුකරුවන් වේ. එම නිසා සෑම ක්‍රියාවලියක් සඳහාම ගතවන කාලය එහි තත්වය අනුව වෙනස් විය හැක	පුරවැසි ප්‍රඥප්තිය සංවර්ධනය කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ හා ක්‍රියාමාර්ග
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමිණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	වාර්ෂික කාර්ය සාධන ගිවිසුමක් සකස් කිරීම සිදු වේ.	වගකිවයුතු නිළධාරියකුගේ අධීක්ෂනය යටතේ සෑම වසරකම වාර්ෂික කාර්ය සාධන ගිවිසුමක් ඇති කිරීම.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ජේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ජේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ජේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		

ඡායාරූප එකතුව

කොන්ක්‍රීට් කුට්ටිගල් ඇතිරූ මාර්ග









කොන්ක්‍රීට් මාර්ග







ග්‍රාමීය පාලම්












පැල රෝපණ වැඩසටහන









ඇමුණුම්

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ආර්ඒඑව්/සී/එස්එම්ආර්ආර්ඕඅයි/එන්/04/2021/06

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 23 දින

ගණන්දීමේ නිලධාරී

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයවෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පිටුව 1 | 12

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මුල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම

පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කරක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අශ්‍රීම සැසඳුම් ප්‍රකාශනය

මුදල් රෙගුලාසි 208 යටතේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරා තිබූ වියදම රු.227,865,951ක් වුවද, එම වියදම රු.227,891,242 ක් ලෙස අශ්‍රීම සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 අමාත්‍යාංශය මඟින් ඉකුත් වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.2,454,659 ක් වූ මූල්‍ය නොවන වත්කම් CIGAS වැඩසටහනට ඇතුලත් කර නොතිබූ අතර ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර්31 දිනට දේපල පිරියත හා උපකරණ ශේෂය හා දේපල පිරියත හා උපකරණ සංචිතය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.2.2 මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුම අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.5,114,902 ක් හා පාලන ගිණුම් ශේෂය රු.5,080,317 ක් ලෙස දක්වා තිබූ නමුත් පාලන ගිණුම් නිවැරදි ශේෂය රු. 4,476,439 ක් වුයෙන් සැසඳීම් ප්‍රකාශනය තුලින් රු.638,463 ක වෙනස නිවැරදිව නිරූපනය වී නොතිබුණි.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ) මුදල් පොත	මුදල් රෙගුලාසි 446(2)	අධීක්ෂණ නිලධාරියා විසින් අත්සන් කර නොතිබුණි, වෙක්පත් අංකය, වැය විෂය හා ගෙවීම් විස්තර නිසි පරිදි ඇතුලත් නොතිබුණි.
(ආ) වැය ලෙජරය	මුදල් රෙගුලාසි 420(ආ) 245(3)	වැයලෙජරය යාවත්කාලීන කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙත වෙන් කර දී තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 30,276 ක් වූ අතර අමාත්‍යාංශය මඟින් ඉල්ලුම් කල අග්‍රිම හා මුදල් රෙගුලාසි 208 යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙන් කර දී තිබූ ප්‍රතිපාදනය පිළිවෙලින් රු.මිලියන 522 ක් හා රු.මිලියන 6,921 ක් විය. කෙසේ වූවද, අමාත්‍යාංශය මඟින් ඉල්ලුම් කල අග්‍රිමයන් වලින් රු.මිලියන 392ක් ගෙවත් සියයට 75 ක් පමණක් ලැබී තිබූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත වෙන්කර දී තිබූ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කර තිබූ මුදල රු.මිලියන 197 ක් ඉනවත් සියයට 3 ක් පමණක් විය.

2.2 වියදම් කළමනාකරණය

2.2.1 අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු.මිලියන 30,276ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,946ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ඉතිරිවීම් රු.මිලියන රු.28,330ක් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 94 ක් විය. එසේම ඉහත දැක්වූ ශුද්ධ ඉතිරි කිරීම්වලින් සියයට 99 ක් හෙවත් රු.මිලියන 28,325ක් ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරිවීම් බව නිරීක්ෂණ වූ අතර ඒ තුළ පරිපූරක ඇස්තමේන්තු යටතේ වෙන් කර තිබූ රු. මිලියන 5,200 ක ප්‍රතිපාදනද සම්පූර්ණයෙන් වැය නොකර ඉතිරි වී තිබුණි.

2.2.2 විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කල යුතු ඒසීඒ -2(III) ආකෘතිය අනුව සංශෝධිත වියදම් ඇස්තමේන්තුව නිවැරදිව දක්වා නොතිබූ අතර ඒ හේතුවෙන් මූලික වියදම් හා සංශෝධිත වියදම් අතර වෙනස ප්‍රතිශතයක් ලෙස දැක්වීමේදී නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලටඅනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(I) මුදල් රෙගුලාසි 396	2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කල නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල වලංගු කාලය මාස 06 ඉක්මවූ එකතුව රු.792,608 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(II) මුදල් රෙගුලාසි 66 හා 66(2)	වියදම් ශීර්ෂයක් තුල වැඩසටහනක, ව්‍යාපෘතියක

වැය විෂයන් සඳහා ඇස්තමේන්තුවල වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන මුදල් වර්ෂය තුල වියදම් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව සහ එම වියදම් ප්‍රතිපාදන ඉක්මවා යෑමට ඉඩ ඇති බව පෙනී යන විට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව අදාල ප්‍රතිපාදන මාරුකර ගැනීම සිදුකල හැකිය.

එහෙත් මු.රෙ.66(2) අනුව කිසියම් වැඩසටහනක මූල්‍ය වියදම් යටතේ ප්‍රතිපාදිතඅරමුදල් ඉන් පිටතට මාරු කල නොහැකි බව දන්වා තිබියදී ඊට අදාල නොවනසේ විගණන නියැදි පරීක්ෂාවට අනුව වැඩසටහන් 01 හි අතිකාල වියදම් රු.785,398 ක් වැඩ සටහන් 02 හී ප්‍රාග්ධන වියදම් වලින් දරා තිබුණි.

(III)මුදල් රෙගුලාසි 571

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ශේෂය රු.72,494,340 ක් වූ අතර එයින් වසර 02 ක් ඉක්ම වූ ශේෂය රු.32,085,651 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන) ගේ 2019 මාර්තු 15 දිනැති ඊඑස්ටී-4/03/එම්එස්එෆ්/0406දරන ලිපිය

සකියකට පැය 20ක් නොඉක්මන පරිදි අතිකාල දීමනා ගෙවීම් අනුමත කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයාට හැකි බව දක්වා තිබු නමුත් නියැදි පරීක්ෂාවට අනුව එම සීමාව ඉක්මවා නිලධාරීන් 12 දෙනෙකුට එකතුව රු.411,779 ක අතිකාල දීමනා වැඩිපුර ගෙවාතිබුණි

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන්ඉටු නොකිරීම

2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 9,500ක් සහ ග්‍රාමීය මාර්ග වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 15,497 ක් ලෙස රු.මිලියන 24,997 ක වෙන් කරවාගෙන තිබුණු අතර ග්‍රාමීය මාර්ග කි.මී. 50,000ක් ඉදිකිරීමේ වැඩ සටහන් යටතේ තවත් රු. මිලියන 20,000ක ප්‍රතිපාදන මහා මාර්ග අමාත්‍යාංශය මඟින් වෙන්කර දී තිබුණි. මෙම මුළු ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අදාලව අමාත්‍යාංශය මඟින් ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර තිබුණද, 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් වූ ප්‍රගති වාර්තාව අනුව අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

3.1.1.1 පාලම් ඉදිකිරීම් කොන්ත්‍රාත් මාස 06 ක් හෝ ඊට අඩු කාලයක් තුල නිම කිරීමට සැලසුම් කර තිබූ නමුත් ප්‍රගතිය ඉතා පහල මට්ටමක පැවතිණි. සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කර තිබූ රු.මිලියන 9,500 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,119 ක් පමණක් වැයකර තිබූ අතර 2021 විසර්ජන ගිවිසුමට අනුව 2021 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 558ක බිල්පත් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී වෙන්කර තිබූ ප්‍රතිපාදන රු.මිලියන 8,381 ක් හෙවත් සියයට 88 ක් වැය කිරීමට අසමත් වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය වේ.

3.1.1.2 සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 35,497ක් වූ ප්‍රතිපාදන භාවිතා කරමින් ග්‍රාමීය මාර්ග 38,537 ඉදිකිරීමට සැලසුම් කලද, 2022 පෙබරවාරි 03 දිනට විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව ඉහත මුළු ප්‍රතිපාදනයෙන් වටිනාකමින් රු.මිලියන 7,018 ක් වූ ව්‍යාපෘතිවල පමණක් වැඩ අවසන් කර තිබූ අතර එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 19.6 ක් පමණක් විය. තවද මෙම සංවර්ධන වැඩ සටහන යටතේ කි.මී.2,839ක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබුණද කි.මී. 536ක පමණක් වැඩ අවසන්කර තිබූ අතර එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 18.87ක් පමණක් විය.

3.1.1.3 අමාත්‍යාංශය මඟින් 2021 වර්ෂයේදී ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය යටතේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 180.1 ක් වටිනා මාර්ග ව්‍යාපෘති 173 ක් ඉදිකිරීම සඳහා හෝමාගම ප්‍රාදේශිය සභාව වෙත ප්‍රතිපාදන වෙන්කර දී තිබුණද, ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 113.5ක් වටිනා මාර්ග

ව්‍යාපෘති 92ක ඉදිකිරීම් පමණක් විගණන දිනය වූ 2022 පෙබරවාරි 10 දින වන විට නිම කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති 160 ක් වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 158.9 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පාලම් ඉදිකිරීම් ව්‍යාපෘති

3.1.2.1 අඩු පිරිවැය පාලම් ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 1,500 ක් වැයකර පාලම් 1,000 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබූ නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු. මිලියන 186.6ක් වටිනා පාලම් 33 ක් පමණක් ඉදි කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයට වෙන් කල ප්‍රතිපාදන වලින් සියයට 75ක් උපයෝජනය කර නොතිබුණි.

3.1.2.2 වාහන ගමනාගමනය කල හැකි පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ පිළිවෙලින් අදියර I හා අදියර II යටතේ පිළිවෙලින් ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 2,547 ක් වූ පාලම් 159 ක් සහ ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 4,317 ක් වූ පාලම් 279 ක් ඉදිකිරීම සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතීගත සංස්ථාව (SD&CC) සහ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.

I. සමාලෝචිත වර්ෂයේදී අදියර I යටතේ ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 2,470 ක් වූ පාලම් 152ක් ඉදිකිරීම සඳහා රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නිතීගත සංස්ථාව (SD&CC) වෙත කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර පාලම් 149 ක් වෙනුවෙන් රු. මිලියන 438 ක අත්තිකාරම් ගෙවා තිබුණි. මෙම ඉදිකිරීම් 2021 වර්ෂය අවසානය වන විට නිම කල යුතු බව දක්වා තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු පාලම් සංඛ්‍යාව 71ක් විය. එසේම අදියර IIයටතේ ඉහත ආයතනය වෙත, ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 2,965 ක් වූ පාලම් 158 ක් ඉදිකිරීම් සඳහා 2021 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබූ අතර මෙම කොන්ත්‍රාත්තු වලින් බොහොමයක් මාස 06 ක කාලයක් තුල නිම කල යුතු වුවත් 2022 පෙබරවාරි 28 දින වන විටත් කිසිදු පාලමක ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

II. අදියර II යටතේ මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඇස්තමේන්තුගත වටිනාකම් රු.මිලියන 1,352 ක් වටිනා පාලම් 121 ක් ප්‍රදානය කර තිබූ අතර ඉන්

රු.මිලියන 1013 ක් වූ පාලම් 93 ක ප්‍රගතිය සියයට 50ට වඩා අඩු මට්ටමක හා රු. මිලියන 539ක් වටිනා පාලම් 28ක ප්‍රගතිය සියයට 50 ඉක්මවා පැවතුණි. කෙසේ වුවද සියයට 50ට වඩා අඩු ප්‍රගතියක් දක්වා තිබූ පාලම් අතුරින් ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 764ක් වූ පාලම් 68ක ප්‍රගතිය සියයට 10ට වඩා අඩු මට්ටමක පැවති අතර රු. මිලියන 157ක් වූ පාලම් 19ක පමණක් ප්‍රගතිය සියයට 75 ඉක්මවා තිබුණි.

මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති

3.1.2.3 ග්‍රාමීය මාර්ග ව්‍යාපෘතිය වෙනුවෙන් මහා මාර්ග අමාත්‍යාංශය මඟින් වෙන් කර තිබූ රු.මිලියන 20,000 ක අමතර ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම උපයෝජනය කර නොතිබූ අතර ග්‍රාමීය මාර්ග රාජ්‍ය අමාත්‍යාංශය වෙත 2021 වර්ෂයේදී වෙන් කර දී තිබූ රු. මිලියන 15,497ක ප්‍රතිපාදනයෙන්ද රු. මිලියන 734ක් හෙවත් සියයට 5ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද 2021 වර්ෂයේ විසර්ජන ගිණුමට අනුව තවදුරටත් රු.මිලියන 288ක බිල්පත් ගෙවිය යුතුව තිබූ අතර ප්‍රතිපාදන ලබාදීම වර්ෂය ආරම්භයේ සිදු නොකිරීම හේතුවෙන් මෙම කර්මාන්ත සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබී තිබූ බවද විගණනයේදී නිරීක්ෂණය විය.

3.2 පාඩු හා හානි

මහාමාර්ග අමාත්‍යාංශයට අයත්ව තිබූ අංක CAU 0786 දරණ මෝටර් රථය 2020 දෙසැම්බර් 01 දින සිට ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. මෙම මෝටර් රථය 2021 ජනවාරි සහ මාර්තු වලදී කි.මී.75,129 පමණක් ධාවනය කර තිබියදී එකතුව රු.6,145,452 ක් වැය කරමින් අළුත්වැඩියා සිදු කර තිබූ අතර අදාල ලිපිගොනු පරීක්ෂාවේදී එය හදිසි අනතුරකට භාජනය වී ඇති බවත් ඒ අනුව රක්ෂණ වන්දි ලබා ගැනීමට කටයුතු කල යුතු බවත් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (යාන්ත්‍රික) විසින් නිර්දේශ කර තිබුණි. තවද ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 වගන්තිය අනුව පාඩුවක් හෝ අලාභහානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනීම හා එයට වගකියයුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර එම වියදම රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයට රු.6,145,452ක පාඩුවක් දැරීමට සිදු වී තිබුණි.

පිටුව 10 | 12

3.3 අනාර්ථික ගනුදෙනු

(අ) අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණක් ලෙස මහ දෙපස රුක් රෝපණ වැඩ සටහනක් හඳුනාගෙන ඒ සඳහා තෙත් කලාපය හා වියළි කලාපය සඳහා සුදුසු පැල වර්ග නිර්දේශ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2.6 ක් වැයකර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පැල 62,545 ක් සිටුවීමට නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා පැලයක් වේනුවෙන් දරා තිබූ ශුද්ධ වියදම රු.41 ක් විය. කෙසේ වුවද මෙම අරමුණට පටහැනිව මහ දෙපස සිටුවීමට නිර්දේශ කර නොතිබූ ශාක රෝපණය හා පැල බෙදාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.763,500 ක් හෙවත් එක් පැලයක් වෙනුවෙන් රු. 925ක ශුද්ධ වියදමක් දරා තිබුණද එම පැල බෙදාහැරීමට අදාල ලැයිස්තුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව ඉහත පැල බෙදා දීම වෙනුවෙන් අමාත්‍යාංශය විසින් දරා තිබූ වියදම ආර්ථික වශයෙන් වාසිදායක ගණුදෙනුවක් වී නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය මඟින් 2021 – 2023 කාල සීමාව තුල මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ග්‍රාමීය පාලම් ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර අමාත්‍යාංශය වෙත ප්‍රජාවගෙන් මෙන්ම දේශපාලන අධිකාරිය තුලින් ලැබී තිබූ යෝජනා විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රමුඛතා පදනම මත හඳුනාගැනීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයට හා විවෘත විශ්ව විද්‍යාලය වෙත සම්මක්ෂණය කිරීම සඳහා යොමුකර ඒ සඳහා රු. මිලියන 31.62 ක් වැය කර තිබුණි. මෙම ආයතන දෙක විසින් දිස්ත්‍රික්ක 6ක සම්මක්ෂණ කටයුතු ක්‍රියාත්මක කර විධිමත් ක්‍රමවේදයකට අනුව ප්‍රමුඛතා පදනමින් ඉදිකිරීම් සිදුකල යුතු පාලම් 6,432ක හඳුනාගෙන ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණද එම පාලම් අතුරින් 2021 දෙසැම්බර් 31 දින වන විට පාලම් 13ක් පමණක් ඉදිකිරීම සඳහා තෝරාගෙන තිබුණි. ඒ අනුව ඉහත ආයතන දෙක වෙනුවෙන් දරා ඇති මුදල් අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

එක්සත් ජාතින්ගේ තිරසාර සංවර්ධන වැඩසටහනට අනුගත වෙමින් අමාත්‍යාංශ මඟින් තිරසාර සංවර්ධන අරමුණු 2ක් හඳුනාගෙන තිබූ අතර ඉකුත් වර්ෂයේ අවසන් කාර්තුව තුල අමාත්‍යාංශය ස්ථාපිත කිරීම නිසා එම අරමුණු ඉටු කර ගැනීමට අදාල ඉලක්ක හා කාර්ය සාධන දර්ශක මේ

පිටුව 11 | 12

දක්වා හඳුනා ගෙන නොතිබුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේදී ග්‍රාමීය මාර්ග අංශයට අදාලව පමණක් ඉලක්ක හා කාර්ය සාධක දර්ශක හඳුනාගෙන තිබුණි. ඒ අනුව ස්ථාපිත කර තිබූ ප්‍රධාන කාර්ය සාධක දර්ශකයන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී නිම කරන ලද ග්‍රාමීය මාර්ග සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස සියයට 16.7 ක් හා අපේක්ෂිත මාර්ග දුර ප්‍රමාණය වූ කි.මී.2839 කින් කි.මී.468 ක් පමණක් නිම කර තිබුණි. තවද ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ප්‍රගතිය සියයට 17 ක් පමණක් වූ අතර සමස්ත මාර්ග හා පාලම් ඉදිකිරීම් ප්‍රගතිය සියයට 49 ට වඩා අඩු මට්ටමක පැවතුනි. අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවට අනුව මූල්‍යමය බාධාවන්, අමුද්‍රව්‍ය හිඟය හා මිල උච්චාවචනයන් ප්‍රගතිය කෙරෙහි සෘජු වශයෙන් බලපා ඇති බව දක්වා තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩල සංයුතිය පහත පරිදි වේ.

සේවක වර්ගය	අනුමත කාර්ය මණ්ඩලය	තත්ව කාර්ය මණ්ඩලය	පුරප්පාඩු / අතිරික්තය
ජේෂ්ඨ මට්ටම	15	07	08
තෘතීයික මට්ටම	1	-	1
ද්විතික මට්ටම	37	15	22
ප්‍රාථමික මට්ටම	11	11	
එකතුව	64	33	31

2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත තනතුරු 64 ක් පැවති අතර ඉන් පිළිවෙලින් ජේෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක, තෘතීයික මට්ටමේ එක් තනතුරක හා ද්විතියික මට්ටමේ තනතුරු 22 ක පුරප්පාඩු පැවතුනි.

එස්.ටී.බී. රත්නායක
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.